## නිවේදනය "A"

ගරු මන්ත්‍රීවරුනි, 2018 නොවැම්බර් මස 14 වැනි බදාදා, 15 වැනි බ්‍රහස්පතින්දා සහ 16 වැනි සිකුරාදා දිනයන්හි පාර්ලිමේන්තු රැස්වීම් පවත්වනු ලැබූ අවස්ථාවලදී සභා ගර්භය තුළ ඇතිවූ සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු පොලීසිය විසින් දැනටමත් සිදුකරමින් සිටින බවත්, ඊට අමතරව එම සිද්ධීන් පිළිබඳව අභ්‍යන්තර පුළුල් විමර්ශනයක් පැවැත්වීමට හැකි වන පරිදි පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක, ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතාගේ සභාපතිත්වයෙන් යුත් හිටපු කථානායක, ගරු චමල් රාජපක්ෂ, ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර, ගරු චන්ද්‍රසිරි ගජදීර, ගරු බිමල් රත්නායක, ගරු මාවෙ සෝ. සේනාධිරාජා යන මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් මා විසින් පත් කරන ලද බවත්, එම කමිටුවේ වාර්තාව හැකි ඉක්මනින් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන බවත්, කාරුණිකව දන්වනු කැමැත්තෙමි.